Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - සති පාසල

**ශ්‍රේණිය - 10 (III වාරය)** | **විෂය - චිත්‍ර කලාව** | **සතිය - සැප්තැම්බර් 04**

01) පාඩම හෝ ඒකකය - 6.1.4. ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ අගයමු

02) ඉගෙනුම් ඵල -

- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ සොයා බලයි.
- යුරෝපීය ස්වභාවිකවාදී සම්ප්‍රදායන්ගේ ආභාසය ඔහුගේ නිර්මාණ ආශ්‍රිත ව විස්තර කරයි.
- නිර්මාණවල චිත්‍රමය ගුණාංග විමසා බලයි.
- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ චිත්‍රවල සුවිශේෂී කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ සිතුවම් පිළිබඳ අවධානයට යොමු කරන්න.
- ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ සිතුවම් එක්රැස් කරන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂය, ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න. ක්‍රිස්තියානි චිත්‍ර කලාවේ නව පෙරළියක් ඇති කළ චිත්‍ර ශිල්පියකු බව හඳුනා ගන්න.
- යුරෝපීය ස්වභාවිකවාදී සම්ප්‍රදායන්ගේ ආභාසය ඔහුගේ නිර්මාණ ආශ්‍රිත ව විස්තර කරමින් ඔහුගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කිරීම
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

## කාර්ය පත්‍රිකාව

01) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

02) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

03) පහත සඳහන් කරුණු යටතේ ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

- තේමාව
- ශෛලිය
- අභාසය
- ශිල්ප ක්‍රමය

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=y1kNHoP3FPI
  https://www.youtube.com/watch?v=TokKfDdxO6Q
  https://www.youtube.com/watch?v=_H9pM4h2EPc
  https://www.youtube.com/watch?v=7-xBYzLZV_U
  https://www.youtube.com/watch?v=4dJ-5_P1H4w
  https://www.youtube.com/watch?v=Fl86PcekVdY
- කියවීම් පත්‍රිකාව -

- ඩේවිඩ් පේන්ටර් වර්ෂ 1900 දී උතුරු ඉන්දියාවේ ඇල්මෝරා හි දී උපත ලැබීය.
- ඔහු එංගලන්තයේ රෝයල් ඇකඩමියේ චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යාපනය ලබා ඇත.
- යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ ස්වභාවිකවාදී චිත්‍ර කලා ආභාසය සහිතව ඔහුටම ආවේණික චිත්‍ර ශෛලියක් නිර්මාණය කරගෙන ඇත.
- ප්‍රවීණ චිත්‍ර ශිල්පියකු වන ඔහු ලංකා කලා සංගමයට අයත් අද්‍යතන යුගයේ චිත්‍ර ශිල්පියකු වේ.
- ප්‍රතිරූප හා භූමි දර්ශන මානව රූප සම්පිණ්ඩන ත්‍රිත්ව දෙව්මැදුරේ බිතු සිතුවම් ඔහුගේ නිර්මාණ සඳහා වස්තු විෂය වූ තේමාවේ.
- ඩේවිඩ් පේන්ටර් චිත්‍ර ශිල්පියාගේ නිර්මාණ ශෛලිය හා චිත්‍ර මූලිකාංග සංරචන කිරීමේ ලක්ෂණ
  - ජීවගුණය හා කායික සුන්දරත්වය මැනැවින් පිළිබිඹුවන ලෙස මානව රූප චිත්‍රණය කිරීම
  - චිත්‍රයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ නිරූපණය
  - මිනිස් ඉරියව් ලාලිත්‍යයෙන් හා හැඟීම් ප්‍රකාශනයෙන් යුතු වීම
  - ත්‍රිමාන ලක්ෂණ සහිත ව දීප්තිමත් වර්ණමාලාවක් භාවිත කිරීම
  - ක්‍රිස්තියානි තේමා නිරූපණය කිරීමේ දී යුරෝපීය සංස්කෘතිය හා භූතලය වෙනුවට ශ්‍රී ලාංකීය සමාජ පසුබිමක චිත්‍රණය කර තිබීම

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- පූජිත සිත්තරු - සොලමන් ප්‍රේමානන්ද


**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**